www.agaram.lk

88555

AL/2015/71/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

සිංහල I
சிங்களம் I
Sinhala I

71 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

**උපදෙස්:**

※ **පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

※ පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

● පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. (අ) ඒ කොලු ද ක්‍රියාවෙන් කුම් වුවත් ජාතීන් හා සම්පත්තීන් උතුම් තරම් ඇති සිටුදුවණියන් රෙදිකඩෙකින් වසාලූ මැණිකක් පරිද්දෙන් කැඳවාගෙන දුරට ගොසින් එක් ගමෙක රඳාහිඳ අයට අඳයට සී සාගෙන, වප් වපුටගෙන දර පළා ගෙනවුත් ජිවත් වෙති. සිටුදුවණියෝ ද කුසරජු ව උපන් බෝසතුන් ප්‍රභාවතීන් නිසා නිකෘෂ්ට ලෙසින් හැසිරුණු නියාවට හුදක් පිරිමීහු ම ගෑනුන් නිසා නිකෘෂ්ට ලෙස අවිදිනෝ නොවෙති. ගෑනුත් පිරිමින් නිසා නිකෘෂ්ට ලෙසින් හැසිරෙතී යන්න හඟවන්නාක් මෙන් කළයෙන් පැන් ගෙනවුත් තබමින් සිය අතින් ම පරමන් පිසමන් ආදිය කෙරෙමින් තමන් යට කළ අකුශලයෙහි අනිෂ්ටවිපාකය වී බත් කමින් සිට හමු බතකුත් කන්නා සේ අනුභව කරන්ට පටන්ගත්හ.

(i) සිටුදියණියගේ ස්වරූපය මෙහි ඉදිරිපත් කොට ඇත්තේ කෙබඳු ආකාරයෙන් ද?

(ii) ජීවත් වීම උදෙසා තරුණයා කවර කාර්යවල නියුතු වූයේ ද?

(iii) සිටුදියණිය ඉටු කළ ගෘහ කටයුතු මොනවා ද?

(iv) **'නිකෘෂ්ට'** හා **'අඳයට'** යන වචනවල තේරුම් ලියන්න. (ලකුණු 04 යි.)

(ආ) එසඳ රිදී දමක් සේ ධවල වූ සොඬ දිගු කොට විමසන්නා වූ මහ බෝධිසත්ත්වයන්ගේ අත බුද්ධාදීන්ගේ අර්හත් ධ්වජය වූ කාසාය වස්ත්‍රය පුෂ්කරාග්‍රයෙහි වැදි පුත්‍ර තෙම තිබූයේ ය. එබඳු වේදනාවෙන් පීඩිත වූ මහ බෝධිසත්ත්ව තෙම සිතනුයේ 'අර්හත් ධ්වජය නම් සත්කාර ගරුකාර කටයුතුය. එබැවින් මොහු මැරිය යුතු නොවෙයි' සිතා ඒ සෝණුත්තර නම් වැදි පුත්‍රයා සොඬින් ඔසවා ඉදිරියෙහි සිටුවා මෙලෙස කථා කරන්නේය. 'රාගාදී කසටින් කිලුටු ව ඉඳුරන් දැමීමක්, සබවසක් නැති යමෙක් කාෂාය වස්ත්‍රය ධරා වඳුරන් පෙරවි සිංහචර්මයක් මෙන් ඒ ඊට යෝග්‍ය නොවන්නේය.

(i) ඇතාගේ දිගු කළ සොඬය උපමා කර ඇත්තේ කුමකට ද?

(ii) මෙහි දැක්වෙන පරිදි චීවරය දැරීමට යෝග්‍ය **නො වන්නේ** කුමනාකාර පුද්ගලයන් ද?

(iii) 'සබවසක් නැති යමෙක් කාෂාය වස්ත්‍රය ධරා වඳුරන් පෙරවි සිංහචර්මයක් මෙන්' මෙහි උපමාව හා උපමේය පැහැදිලි කරන්න.

(iv) **'පුෂ්කරාග්‍රයෙහි'** හා **'සබවසක්'** යන වචනවලට අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

(ඉ) එම්බා සොඳුර, තොපගේ මොළොක් වූ අතුල් තල නමැති ළඳ පල්ලවයෙන් අලංකෘත ව තෙව්නා මනහර තෙල බාහු යුග්මය ශරීර නමැති කල්පලතායෙන් අටගත් ආශ්චර්යවත් වූ අරළු දෙකක් මෙන් හොබනේ ය. තව ද තොපගේ මඳසිනා නමැති චන්ද්‍රකාන්තීන් යුක්ත වූ මුඛ නමැති චන්ද්‍රතෙම මාගේ සිත් නමැති කෞමුද වනය විශේෂයෙන් ප්‍රබෝධ කරවයි. තව ද තොපගේ අතිරක්ත වූ අධරයුග්මයෙහි රශ්මීන් රැඳුණා වූ දන්තපන්තීහු විලිකුන් දෙළුම්බිජු පෙළක් මෙන් බබළන්නාහ. තව ද අනංගයාගේ මාලිගාදොර නොහොත් රතිමැදිරිදොර රන් යටෙක බඳනා ලද නිල් ධ්වජදෙකක් හා සමාන වූ තොපගේ බැම සඟළ කාමීපුරුෂයන් තමා කරා කැඳවන්නාක් මෙන් විශේෂයෙන් බබළයි.

(i) මෙහි වර්ණිත කාන්තාවගේ බාහු උපමා කොට ඇත්තේ කුමකට ද?

(ii) ඇයගේ දත් විලිකුන් දෙළුම් බීජ පෙළක් මෙන් දිස් වූයේ කවර ආකාරයෙන් ද?

(iii) ඇයගේ දෙබැම විශේෂයෙන් බබළන්නේ කුමන අයුරින් ද?

(iv) **'ළඳ පල්ලවයෙන්'** හා **'තෙව්නා'** යන වචනවල තේරුම් ලියන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



(ඊ) එ න සඳ පෙර මෙ පුර කිරි සිඳු දුව තුටු ව
සිඳු රද විසින් ඇය රැකවරණට කැටු ව
ප රි ස ඳ එවූ සිඳු කඬකෙවි නො ව පටු ව
ඇ ම සඳ පිරුණු දිය'ගල ලොබ වෙයි දුටු ව

සු වි ස ල් අගල දිය තුළ පෙනෙන මනහර
ර ළ වු ල් සසල රිවි සඳ මඬල පැහැසර
තු ගු තු ල් පවුරු හිස පැන යනු බැරි ව හැර
ර ස හ ල් පිවිස හැම වර යනු වැනි මිතුර

(i) සමුද්‍රරාජයා ස්වකීය දියණියගේ ආරක්ෂාව සඳහා එව්වේ කුමක් ද?
(ii) කවියාට අනුව ප්‍රාකාරයෙන් පැනයාමට නොහැකි ව සිටින්නෝ කවුරු ද?
(iii) **'රළවුල් සසල'** යන්නෙන් වෙසෙසා දැක්වෙනුයේ කුමක් ද?
(iv) **'කිරිසිඳු'** හා **'රසහල්'** යන වචනවල තේරුම් ලියන්න. (ලකුණු 04 යි.)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.
(i) "නුඹ මට ජීවිතයක් වැනි බිසවුණි, මේ මිනිස් ලොව ඇති යම් සැපතක් ඇත්නම් එම බොහෝ ව ඇත්තේ ය."
(ii) "වේලා නොවරදවා මෙතෙක් කතර යා හැකි දැ'යි"
(iii) "සත්පුරුෂයන්ට මෛත්‍රී කිරීම සත්පුරුෂයන්ගේ ස්වභාව ධර්මයෙක් ම ය."
(iv) "දැන් ඔහොම කිවුවට මොකො ද, ඉස්සර නම් ඔහොම නොවේ කතා කළේ"
(v) "මම සතුටු නෑ ඔබතුමාට අප්‍රිය දෙයක් කියන්ඩ"
(vi) "තාත්තා නැති වුණාට පස්සේ මම ගෙදර නැවතුණා." (ලකුණු 08 යි.)

(ඌ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

ඔබා දෙදණ නිල් උඳුපියළි බිම මත
වැන්දේ ය ඔහු බැති සිතින්
අම්මා වැළලූ තැන මහ පොළොවට;
පිපිලා තිබුණි එතැන සුදු පාටට
නමක් නොමැති පුංචි මලක්
සිම්බේ ය ඔහු එමල නමා හිස

දස මසක් කුස තුළෙහි දරා සිට
මා ලොවට වැදූ අම්මා ඔබ ය.
කෙළවරක් නොමැති දුක් දරා විඳ
මා ලොවට හැදූ අම්මා ඔබ ය.

අඬන විට මා කුඩා අවධියෙහි බඩගිනි ව
තම්බා බතල දළු
ලුණු දියර ඉස
පොල් ගා මුසු කොට කවා
බඩගිනි නිවූ අම්මා ඔබ ය.

උයා උදයෙන් නැගිට කඩයප්පන්
තබා තේ කඩයෙහි
ලබා ඉන් ලැබෙන සුළු වට්ටම
ජංගි ඇන්දූ අම්මා ඔබ ය.

ගල්වා ඉසෙහි තෙල් යහමින්
එල්ලා කරෙහි පංචායුදය
අල්ලා ගෙන අතින් මා
පාසලට එක්ක ගිය
අකුරු නුගත් අම්මා ඔබ ය.

[තුන්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



ඇවිද ලඳු දෙණි කැලෑ බිම්වල
රැගෙන විත් තුන්හිරිය පත් කොළ
යොදා කුකුල් සායම් රතු හා කොළ
වියා නෙක් විසිතුරු රටා පැදුරු
රටාවක් බව මේ මහා විශ්වය
කුඩා කල සිට ම මට
කියා දුන් අම්මා ඔබ ය.

නොදත්තෙමි මම එකල
අම්මේ, ඔබ වත කැටපතක් බව;
මෙකල මා සිත පිළිබිඹු කරන
ගිලී යට ගිය ඇස් කුහර තුළ
නොදුටුවෙමි කිසිවිටක සතුටක්
නොදුටුවෙමි කිසිවිටක දුකකුත්.

ඉවසා සම සිතින් සැම සැප දුක්
ලැබුවා ද ඔබ සිතෙහි සාමයක්?
ඉපයුවෙමි මම මුදල්
ඉපයුවෙමි කිතු යසස්
වී ය මන්දිර යාන වාහන.
එහෙත් ඒ කිසිවකිනුත්
නොලදිමි සිත් සැනසුමක්.
වටහාගෙන සිටියා ද ඔබ ඒ සත්‍යය
නොලබා ම ඔබ ඒ කිසිවක්? (ලකුණු 16 යි.)

2. "සද්ධර්මරත්නාවලිය උසස් සාහිත්‍ය කෘතියක් බවට පත්වීමට හේතු වූයේ මානව චර්යාවන් සම්බන්ධයෙන් කතුවරයා ප්‍රකට කරන ජීවන දෘෂ්ටියයි." නියමිත කතා ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**නැතහොත්**

"ජාතක පොත සහෘදයාගේ සම්භාවනාවට පාත්‍ර වූ කෘතියක් බවට පත් වන්නේ පොදු මිනිස් අත්දැකීම් විවරණයෙහි ලා කතුවරයා විදහා දක්වන සියුම් නිරීක්ෂණ ශක්තිය හේතුවෙනි." නියමිත කතා **දෙකක්** ඇසුරෙන් උක්ත කියමන පිරික්සන්න. (ලකුණු 15 යි.)

3. පුද්ගල ජීවිතවල පවත්නා හොඳ පැත්ත මෙන් ම නරක පැත්ත ද සියුම් ලෙස විවරණය කිරීම සඳහා සද්ධර්මාලංකාර කතුවරයා දැරූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී ඇත් දැ'යි නිර්දිෂ්ට කථා ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

4. "සාම්ප්‍රදායික කාව්‍යාලංකාරවලින් පෝෂිත වූ බස්වහරක් භාවිත කළත්, නිර්ව්‍යාජ අත්දැකීම් ඇසුරෙන් සජීවී ලෙස රමණීය වර්ණනා ඉදිරිපත් කිරීම නිසා ගිරාසන්දේශය පාඨකයාගේ සිත් ඇද බැඳ ගනී." වර්ණනා **දෙකක්** ඇසුරෙන් විභාග කරන්න. (ලකුණු 15 යි.)

5. "එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ 'මළගිය ඇත්තෝ' නවකතාවෙන් නිරූපණය වන්නේ ස්ත්‍රී-පුරුෂ ප්‍රේමයේ ආකූලත්වය හා ගුප්ත ස්වරූපයයි." විමර්ශනය කරන්න. (ලකුණු 15 යි.)

6. "අවිවේකී ජීවන රටාවත්, ආරෝපිත පුහු මානයත් හේතුවෙන් දුරස්ථ වී ගිය මානව සම්බන්ධතා මැනවින් නිරූපණය කෙරෙන කෙටිකතාවක් ලෙස ජයතිලක කම්මැල්ලවීරගේ 'තාත්තාගේ මළගම' අගය කළ හැකි ය." විමසන්න. (ලකුණු 15 යි.)

7. පුද්ගලයා මුහුණපාන සමකාලීන සංකීර්ණ සමාජ ප්‍රශ්න කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා නූතන කවීන් සමත් වී ඇති ආකාරය නූතන පද්‍ය සංග්‍රහයේ ඇතුළත් පද්‍ය පන්ති **තුනක්වත්** නිදසුන් කොට දක්වමින් පහදන්න. (ලකුණු 15 යි.)

8. රත්නාවලී නාට්‍යය රචනයේ දී කතුවරයා අනුගමනය කළ ශිල්පීය උපක්‍රම කොතෙක් දුරට සාර්ථක වී ඇත් දැ'යි විමර්ශනය කරන්න. (ලකුණු 15 යි.)

* * *

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

88555

විභාග අංකය : ..........................

උපදෙස්:
- ※ **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ※ **1** ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- ※ **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. **අඝෝෂ මහාප්‍රාණාක්ෂර** පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) ඝ, ඣ, ඪ, ධ, භ
(2) ඝ, ඨ, ඩ, ඵ, භ
(3) ඛ, ඡ, ඨ, ථ, ඵ
(4) ඛ, ඡ, ඣ, ථ, ඨ
(5) ඩ, ථ, ධ, ඵ, භ
(.........)

1.2. **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) උච්ඡාරණය, උද්ඝෝෂණය, පරිගණකය, දෘෂ්ඨිගෝචර, සමස්ථලංකා
(2) උච්චාරණය, උද්ඝෝෂනය, පරිගණකය, දෘෂ්ඨිගෝචර, සමස්තලංකා
(3) උච්ඡාරණය, උද්ඝෝෂණය, පරිඝනකය, දෘෂ්ටිගෝචර, සමස්ථලංකා
(4) උච්චාරණය, උද්ඝෝෂණය, පරිගණකය, දෘෂ්ටිගෝචර, සමස්තලංකා
(5) උච්චාරණය, උද්ඝෝෂනය, පරිඝණකය, දෘශ්ටිගෝචර, සමස්තලංකා
(.........)

1.3. **අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති** පද පේළිය තෝරන්න.
(1) අඹ, දඹ, නාරං, කෙසෙල්
(2) අන්නාසි, මිදි, පැපොල්, ලොවි
(3) ඇපල්, ජම්බු, රඹුටන්, දූරියන්
(4) උගුරැස්ස, වරකා, දිවුල්, දෙළුම්
(5) කොමඩු, දොඩම්, සියඹලා, හිඹුටු
(.........)

1.4. පහත සඳහන් වරණ අතුරෙන් **නිවැරදි ප්‍රකාශය** තෝරන්න.
(1) 'අඃ' යන්න විසර්ගය, ද්විබින්දු, අනුස්වාර යන නාමයන්ගෙන් ද හැඳින්වේ.
(2) 'අඃ' සහ 'හ්' යන අක්ෂර භාවිතයේ වෙනසක් නැත.
(3) 'අඃ' යන්න වෙනුවට 'අං' යන්න ද යෙදිය හැකි ය.
(4) 'අඃ' යන්න කණ්ඨජ අක්ෂරයකි.
(5) 'ඃ' යන්න හල් අක්ෂරයකට පසුව ද යෙදේ.
(.........)

1.5. **යංශය, රේඵය, රකාරාංශය හා ගයනුකිත්ත** සහිත වචන **අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) වාක්‍යය, ස්වර්ගීය, වක්‍ර, වනෞෂධ
(2) භාග්‍යය, අක්‍රමවත්, බෞතීස්ම, සඟීය
(3) ගද්‍යය, අලෞකික, චර්ම, ව්‍රතය
(4) ව්‍යය, අවර්ණ, අබෞද්ධ, ක්‍රයශක්තිය
(5) ශාක්‍ය, ප්‍රබල, සමර්පණය, මෞන
(.........)

1.6. එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.
(1) පියෙදූ කිරිය, මිහිඳු තෙර, රජමහා විහාරය, අගමැති මන්දිරය
(2) සූර්ය මණ්ඩලය, භාරත දේශය, තෑගි ප්‍රදානය, ඡන්දස් ශාස්ත්‍රය
(3) හස්තිශෛල පුරය, විද්‍යුත් ආලෝකය, ථූප වංශය, මූල්‍ය ප්‍රතිපාදන
(4) කාන්තා කාර්යාංශය, රාජ්‍ය සභාව, සන්ධ්‍යා පුවත්, යහ පාලනය
(5) සර සඳ, සුබ පැතුම්, ලිඟු අදියර, අග විනිසුරු
(.........)

1.7. **තත්සම වචන පමණක්** යෙදී ඇති වරණය කුමක් ද?
(1) නීති, වීථි, භීති, බාහි
(2) ආලෝක, ආලාප, ආහාර, ආකාර
(3) සුන්දර, මන්දර, ගින්දර, කින්නර
(4) දේශිත, භාෂිත, බාධිත, සාදත
(5) සිරි, දිරි, පිරි, කිරි
(.........)

1.8. මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) අසංවර - සංවර, සංයත, දැමුණු, දාන්ත
(2) වංක - නොවක්, අවංක, අකුටිල, ඍජු
(3) අප්‍රධාන - ප්‍රමුඛ, ප්‍රධාන, මුඛ්‍ය, අවශේෂ
(4) අසරණ - පිහිට, සරණ, උපකාර, උදව්
(5) දුඃඛ - ප්‍රීති, සුඛ, සන්තුෂ්ටි, ප්‍රහර්ෂ
(.........)

1.9. මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක්** ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) වන - අරණ්‍ය, අටවි, කැළය, අරණ
(2) ශක්‍රයා - විදුරවි, වජ්‍රපාණි, සහසැස්, පුරඳුරු
(3) වායු - වාත, සුළඟ, අනිල, මාරුත
(4) ආචාර්ය - ඇදුරු, ගුරු, ශික්ෂක, අධ්‍යාපක
(5) චන්ද්‍රයා - තාරපති, නිශාකර, සිසි, දිනකර
(.........)

[දෙවැනි පිටුව බලන්න.

agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk



1.10. **විභක්ති, විශේෂණ, අනකාර්ථ, අව්‍යය** යන සමාසවලට අයත් පද **පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(1) පරපුටු, දසපනත, දසබල, දුසිරිත්
(2) තැඹිලිතෙල්, සුන්බත්, තිලෝ, අබල
(3) ගත්කරු, නරසී, අනුවර්තන, සඳවත්
(4) ගිනිබිය, ලඹසවන්, රතුපුල්, ප්‍රබුද්ධ
(5) බඹලොව, නිවහල්, ඇම්බුරු, නිල්අහස (.........)

1.11. **කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.
(1) පෑ, ගෑ, කෑ, ලෑ
(2) මැරුම්, හැඬුම්, රවුම්, වැටුම්
(3) බැලෙනා, නැටෙනා, රැකෙනා, රැඳෙනා
(4) ස්මරණ, කරණ, චරණ, මරණ
(5) දිවීම්, පැනීම්, වැලපීම්, ගැයීම් (.........)

1.12. පහත සඳහන් වැකිවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය** පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "සැළලිහිණිය **වඩු** කැලණිය පුරවරට"
(ආ) "**සිඳිත**, මඩිත එක ලෙස පැතිරෙයි සුවඳ"
(ඉ) "**පාලා** ගිය වැනි බහුරූ කෝලම්"
(ඊ) "ආයු බෝ **වේවා!**"
(1) විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා
(2) පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා
(3) ආශීර්වාදක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා
(4) විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා, ආශීර්වාදක්‍රියා
(5) ආශීර්වාදක්‍රියා, විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා (.........)

1.13. **අනුක්ත පද දෙකක්** හා **උක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.
(1) දෙවඟනක, ඊරියක්, පාලකයෙක්, ඇතැමෙක්
(2) පැටවකු, මුනිදාසයන්, මහතකු, නයෙක්
(3) කෙනකු, අප, අම්මාවරුන්, රෝගියෙක්
(4) අසන්නෙක්, රඟන්නකු, මනාලියක්, ඇතෙක්
(5) වඳුරකු, නැණවතෙක්, තා, බැල්ලියක් (.........)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.
(1) අවගමන, අවගුණ, අවතල, අවපාත
(2) ඉම්හිරි, ඉපැරණි, ඉබොහෝ, ඉවහල්
(3) වියෝග, විදුලිය, විචල්‍ය, විසන්ධි
(4) සුමුදු, සුමට, සුසුදු, සුදුල
(5) සංයුක්ත, සංයෝග, සංප්‍රේෂණ, සංපීඩ්‍යතා (.........)

1.15. "**වෛශාඛෝත්සවය අනුස්මරණය** කරනු වස් **දර්ශනීය** තොරණ ඉදිකිරීම **අද්‍යතන** සම්ප්‍රදායය යි" යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් ඇති පද** අයත් වන්නේ මෙයින් කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සන්ධි, සමාස, කෘදන්ත හා තද්ධිත
(2) සන්ධි, සමාස, තද්ධිත හා කෘදන්ත
(3) සමාස, සන්ධි, තද්ධිත හා කෘදන්ත
(4) තද්ධිත, සන්ධි, කෘදන්ත හා සමාස
(5) සන්ධි, තද්ධිත, කෘදන්ත හා සමාස (.........)

1.16. ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) වන්දනීය, පූජනීය, කරණීය, ය්‍යපනීය
(2) කොල, එම්බා, බොල, එම්බල
(3) මුහුණත, සවනත, අවනත, නුවනත
(4) වයෝවෘද්ධ, යශෝරාව, තපෝධර, මනෝවෘත්ති
(5) බලව, නටන්න, කියග, අස (.........)

1.17. **සමාසයක් නො වන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.
(1) ගල්පඩි, රන්කම්, දීබත්, ළමාපොත්
(2) දුදන, දුහුල, දුලද, දුබල
(3) පැරකුම්නිරිඳු, මහඹසුපඩි, දනපල්ඇත්, මලියදෙව්තෙර
(4) සිහවගවලස්, පලුපලමල්, ඇඳපුටුමේස, ඇස්කන්නාස්
(5) වතකමල, තිසරතන, අතුල්පියුම්, නෙතුපුල (.........)

1.18. **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.
(1) අතිනත, දකුණත, දිගත, සුරත
(2) කොස්සැට, උරුමක්කාර, අල්ලස්, පොල්ලත්ත
(3) ශාස්ත්‍රාලය, මුනීන්ද්‍ර, ක්‍රිස්තුත්පත්තිය, යථාර්ථ
(4) ජාත්‍යාලය, විද්‍යාලය, හස්ත්‍යලංකාර, කාව්‍යාවලිය
(5) පුනරුත්, මෙයාකාර, කටුවල, ඇවුරුදු (.........)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වාක්‍යය** තෝරන්න.
(1) අවුරුදු කාලයෙහි මඟ දෙපස සල්පිල් ඇත්තාහ.
(2) ජපන්නු හපන්නු ලූ.
(3) අමාත්‍යතුමා ජනතාව අමතනු ලබයි.
(4) සියලු ඥාතිමිත්‍රාදීන් මේ කණගාටුදායක නිවේදනය පිළිගනිත්වා!
(5) එක් කෙනෙක් තරගය ජයග්‍රහණය කළහ. (.........)

1.20. **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.
(1) භාෂාසංවර්ධනයෙහි ලා භාෂාප්‍රේමීත්වය මහ මෙහෙයක්ඉටුකරයි.
(2) පරාක්‍රමබාහුමහරජාණන්වහන්සේ පොළොන්නරුව අග්‍රරාජධානිය කර ගත් හ.
(3) ආක්‍රමණශීලී ශාකයක් වන යෝධ නිදිකුම්බා පරිසරයට අතිශයින් හානිකර ය.
(4) වැලවරකාකජ්ජුපුහුලන් යනු වවුලන් බෙහෙවින්ම ප්‍රියකරන පලතුරු ය.
(5) සත්‍යය ගරුකරන්නා වූ ත් ප්‍රඥා ව දල්වන්නා වූ ත් මනුෂ්‍යප්‍රජාවක් රටට අවශ්‍ය ය. (.........)

(ලකුණු 20 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

| | |
|---|---|
| සිංහල | II |
| சிங்களம் | II |
| Sinhala | II |

71 S II

## II කොටස

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලක්දිව දේශපාලන සංස්ථා විකාශනය දෙස අවධානය යොමු කිරීමේ දී දක්නට ලැබෙන භාරතීය සංස්ථාවල ආභාසය ද විමසිල්ලට ලක් විය යුතු ය. ලක්දිව පාලන තන්ත්‍රයෙහි භාරතයේ ඍග්වේද කාලය තරම් ඈත අවධියක එන ග්‍රාමණී වැනි නිලධාරීහු ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ම හමු වෙති. එසේ වුව ද ඔවුනට අයත් කාර්යයන් හෝ තත්ත්වය අතින් හෝ ඔවුනොවුන් සමාන කළ නොහැකි බැව් සිහිපත් කළ යුතු වේ. භාරතයේ ප්‍රකට ව දක්නට ලැබෙන 'මහරජ' වැනි රාජවිරුද සිංහල රජවරුන් මුල සිට ම ව්‍යවහාර කළ බවට සෙල්ලිපි දෙස් දෙයි. රාජාභිෂේකය වැනි උත්සව පිළිබඳ ව ප්‍රමාණවත් සාධක ශේෂ වී නැතත්, එහි දී භාරතීය අභිෂේකයේ බලපෑමක් නොතිබිණැ'යි කිව නො හැකි ය. දේවානම්පියතිස්ස රජුගේ අභිෂේකය අශෝක අධිරාජයාගේ අනුග්‍රහයෙන් සිදු කරන ලද්දේ නම් එහි දී භාරතීය පිළිවෙත් ගරු කළ බැව් සිතීමට ඉඩ තිබේ. එහෙත් භාරත රජවරුන් සාර්වභෞම බව දක්වමින් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වූ අශ්වමේධ රාජසූය වැනි යාගහෝම මෙරට රාජත්වය විකාශනයෙහි කිසි ම අවස්ථාවක දක්නට නො ලැබේ. රාෂ්ට්‍රපාලනයේ ප්‍රධාන ලක්ෂණ ලෙස කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයේ දැක්වෙන අන්දමට යුද්ධ හමුදාව (දණ්ඩ) භාණ්ඩාගාරය (කෝෂ) හා චරපුරුෂ සේවය මහාපරාක්‍රමබාහුගේ පාලන යන්ත්‍රයේ ද ප්‍රමුඛ අංගලක්ෂණ බවට පත් වී තිබුණු බැව් දක්වා ඇතත් එම ප්‍රවෘත්තිය වුව ද එසේ ම පිළිගත යුතු නො වේ. පරාක්‍රමබාහු රජුගේ චරිත නිරූපණයේ දී මෙන් ම රාජ්‍යපාලන සංවිධාන විස්තර කිරීමේ දී චූලවංසකරු කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රය ආධාර කර ගැන්ම ද සිදු වීමට ඉඩ තිබුණු බැවිනි. එහෙත් මෙකී බලපෑම්වල ප්‍රකෘති ස්වරූපය පිළිබඳ ව වඩාත් පරීක්ෂාකාරී වීමේ දී, එකී සංස්ථා ද දේශීය බලපෑම් අනුව විකාශනය වූ බැව් සැලකීමට පිළිවන. මේ ගැන විවරණයකට මෙහි අවකාශ නැතත්, ලක්දිව රාජත්වය විකාශනය වූ ආකාරය මීට කදිම නිදර්ශනයකි.

(i) භාරතීය රජවරුන් විසින් බහුල ව භාවිත කරන ලද මහරජ වැනි විරුද නාම ලංකාවේ රජවරුන් විසින් ද භාවිත කරන ලද ආකාරය තහවුරු කෙරෙන්නේ කවර මූලාශ්‍රයකින් ද?

(ii) රාජාභිෂේකය සම්බන්ධයෙන් භාරතීය සිරිත් විරිත් මෙරටට බලපාන්නට ඇති බව ලේඛකයා පවසන්නේ කුමන කරුණක් නිසා ද?

(iii) කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයෙහි සඳහන් වන රාජ්‍යපාලනය සම්බන්ධ ප්‍රමුඛ අංග මොනවා ද?

(iv) ක්‍රි. පූ. යුගවල සිට ම භාරතීය බලපෑම මෙරට පාලන තන්ත්‍රයට ලැබුණු බවට මෙහි සඳහන් සාක්ෂිය කුමක් ද?

(v) මෙම පාඨයෙහි සඳහන් වන පරාක්‍රමබාහු රජතුමා පිළිබඳ තොරතුරු සඳහන් වන වංසකතාව කුමක් ද?

(ලකුණු 10 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සුවදායී ජීවිතයක් අපේක්ෂාවෙන් ස්වභාවධර්මය අභිභවනය කොට මනුෂ්‍ය සංහතිය විසින් නිර්මාණය කර ගන්නා ලද තාක්ෂණය මිනිසා විසින් මිනිසාට ම එරෙහිව යෙදවීම විසිවන සියවසේ වඩාත් තදින් තහවුරු විය. න්‍යෂ්ටික අවි නිෂ්පාදනය සහ අධිරාජ්‍යවාදී ප්‍රචණ්ඩ යුද්ධ සැලසුම් ද මෙකල අන් සියල්ල අභිභවා ප්‍රමුඛත්වයට පැමිණ ඇත. සමස්ත මානව පැවැත්ම ම ඛේදවාචකයක් බවට පමුණුවාලන මේ තත්ත්වය කලාවේ විෂය ක්ෂේත්‍රය පෘථුලත්වයට පත් කිරීමට හේතු වී තිබේ. අප්‍රිකානු, ඉන්දියානු, වියට්නාම් හා පලස්තීන සාහිත්‍ය කෘති මේ සඳහා මනා නිදසුන් සපයයි. මෙහි ම ප්‍රතිපක්ෂය ගතහොත් මානුෂික පැවැත්මෙහි ද, එහි ප්‍රතිඵල වශයෙන් සාහිත්‍යයේ හා කලාවේ ද විනාශය සිදු කිරීමට ක්‍රියාත්මක වනු ඇත්තේ ද මේ වෛෂයික පදනම ම ය. මානව සංහතිය පෘථිවිතලයෙන් අතුගා දමා දේශදේශාන්තරයන් තමතමන් අතර බෙදා හදා ගැනීමට ලොව මහ බලවතුන් සැලසුම් කරන යුද්ධෝපායයන්ගේ න්‍යෂ්ටිය ලෙස තාක්ෂණය ම ක්‍රියාත්මක වෙයි.

තාක්ෂණය මානව සංහතියේ හා කලාවේ වර්ධනය සඳහා ඉටු කර ඇති එමෙන් ම ඉටු කරන්නා වූ මෙහෙවර අනුපමේය ය. එහෙත් තාක්ෂණය මනා සැලසුම්කරණයකින් යුක්ත කොට ලක්ෂ සංඛ්‍යාත මහජනතාවගේ උරුමයක් බවට පත් කරන තෙක් එය විලංගු ලා සිර අඩස්සි කළ ලෙසකින් පවතියි. මනුෂ්‍ය ඝාතන ද, ඒ සඳහා ඇති දුෂ්ට සැලසුම් ද සුණුවිසුණු කොට මහජනයාට තාක්ෂණයේ විපුල ඵල නෙළා ගත හැකි වන්නේත්, එය වඩවඩාත් උච්ච මට්ටම කරා වර්ධනය කළ හැකි වන්නේත් එහි පසු ගමන්කරුවකු වන සාහිත්‍යයේ හා කලාවේ පුනර්ජීවනයක් ඇති කළ හැකි වන්නේත්, තාක්ෂණය බැඳ දමා ඇති යදම් ලිහා බහුජන අයිතියට පවරා මානව ප්‍රගතිය ඒකායන අරමුණ කොට ගත් විද්‍යාත්මක සැලසුම්කරණයකට භාජන කිරීමෙන් ම පමණි.

(ලකුණු 15 යි.)

[හතරවැනි පිටුව බලන්න.

agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk



**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) රටක සංවර්ධන ක්‍රියාවලියෙහි ලා ආත්මාර්ථයෙන් තොර දේශපාලන සංස්කෘතියක ඇති වැදගත්කම
(ii) සාරධර්ම සපිරි සමාජයක් බිහි කිරීම උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග
(iii) දේශීය වෛද්‍ය විද්‍යා ප්‍රතිකර්ම මහජනතාව අතර ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව
(iv) මෙරට ග්‍රාම සංවර්ධනය උදෙසා ශ්‍රමදාන සංකල්පය ක්‍රියාත්මක කිරීමෙන් ලද හැකි පිටුබලය
(v) සමාජ වෙබ් අඩවි මගින් ශ්‍රී ලංකාවේ තරුණ පරපුර කෙරෙහි ඇති වන බලපෑම
(vi) විද්‍යුත් අධ්‍යාපන ක්‍රමයක් (E-Learning) මෙරටට හඳුන්වා දීමේ යෝග්‍යතාව (ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදෝස් තැන් ඇතොත් නිදෝස් කොට** ලියන්න.

(i) නගරයෙහි ළමයි සඳහා වෙන් කරන ලද එළිමහන් උද්‍යානයක් ඇත.
(ii) මම ගුණපාල නම් කම්කරුවෙක් වෙමි.
(iii) දෝන ඉසබෙලා නොහොත් ගජමන් නෝනා ප්‍රකට කිවිදියක් වූවා ය.
(iv) ප්‍රකට නවකතාකරුවකු වූ මාර්ටින් වික්‍රමසිංහ දක්ෂ කෙටිකතාකරුවකු ද වෙයි.
(v) නායකයන් නිසි මඟ දක්වති'යි මිනිසුන් සිතති. (ලකුණු 05 යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) මුත්තණුවෝ අරණ්‍යයේ දී තාපසයන් වහන්සේ වැන්දහ.
(ii) වැද්දා ගිරවා ද කුඩුව ද වළට පෙරළා දමයි.
(iii) ඕ තොමෝ තියුණු ස්වරයෙන් කිසිවකු ඇමතුවා ය.
(iv) රාජ්‍ය නායකයෝ සම්මන්ත්‍රණ ශාලාවේ දී තොප පැසසූහ.
(v) රජවරු වහලුන් ලවා බලෙන් වැව් සාදවති. (ලකුණු 05 යි.)

(ඉ) **නිවැරදි වාක්‍යයක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) කෙනෙක් (වැනසෙයි/වැනසෙති) හැනී හුල්වල
(ii) ඔවුහු (මා/මාව) පීඩනයට ලක් කරති.
(iii) පර සතුරන් (එති එති/ එයි එයි) යන බසටා
(iv) මේ සම්භාවනීය ආරාධිත අමුත්තෝ මා විසින් පිළිගනු (ලබමි/ලැබෙති).
(v) ජාත්‍යන්තර සමුළුවට රාජ්‍ය (නායකයන්/නායකයෝ) පැමිණ නැත. (ලකුණු 05 යි.)

**5.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) සමාජ අසාධාරණය නිසා සමහරු **අපේක්ෂාභංගයට** පත් වෙති.
(ii) **ලලනාධිපත්‍ය** සංකල්පය ද සමාජ ප්‍රගතියට අහිතකර ය.
(iii) ඇතැම්හු **පරවාදඛණ්ඩනයට** පමණක් උත්සුක වෙති. (ලකුණු 03 යි.)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) තමා උසස් සේ සැලකීම
(ii) දත් හා තොල් ආශ්‍රය කොට ගෙන හටගන්නා (අක්ෂර)
(iii) රාත්‍රියෙහි සැරි සරන (ලකුණු 03 යි.)

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

(i) ධාවන ................................ මේරියන් ජෝන්ස් ලෝකප්‍රකට තැනැත්තියකි.
(ii) අන්‍යයන්ගේ වැරදි දෙස බලන විට ඔහුගෙන් සිදු වූ වරද ඉතා ................................ ය.
(iii) සුරා ධූර්තයෝ ................................ ශාලාවට ප්‍රවිෂ්ට වූ හ.
(iv) උපාධි ප්‍රදානෝත්සවයේ දී එක් ශිෂ්‍යයෙක් කලා ..................... උපාධිය හිමි කර ගත්තේ ය.
(v) පාරිභෝගිකයෝ උත්සව සමයෙහි ................................ ශාලාවලින් ආහාර පාන ගනිති.
(vi) මේ මාර්ගය ලිස්සන ................................ ය. (ලකුණු 03 යි.)

**(සුලු/සුළු/ ආපාන / ආපණ / සූරි/ශූරි)**

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) ගොවියා **වස** පානය කොට මිය ගියේ ය.
(ii) ඔහුගේ මුවින් පිට වූ **වදන** සිතට වේදනා ගෙන දෙන්නකි.
(iii) **පිය** සෙනෙහස ද මව් සෙනෙහස මෙන් ම අගනේ ය.
(iv) වැවෙහි **දිය** දහර කෙත්බිම් සරු කෙළේ ය.
(v) **පල** නොකියා පලා බෙදනවා වගෙයි.
(vi) **අදර** විබත යන්න ම ආධාර විභක්ති යන නාමයෙන් ද හැඳින්වේ. (ලකුණු 06 යි.)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

[පස්වැනි පිටුව බලන්න.

www.agaram.lk



6. තද කළු අකුරෙන් දී ඇති පද **කුමන ව්‍යාකරණ අංගයකට හා අනුඅංගයකට අයත් දැයි** දක්වන්න.

(i) **කම්කරුවා වනයේදී මංමුළා** වූ ගවයකු ඇල්ලී ය.

(ii) චක්‍රවර්ති **රාජේන්ද්‍රයා මනුලොවට අග්‍රතම** වෙයි.

(iii) **සොරමුළ රන්රිදී** අබරණ ගෙන **තාප්පයෙන්** පැන පලා ගියහ.

(iv) **මළ** මිනිසකු දුටු ආරක්ෂකයා **වහ-වහා ග්‍රාමසේවක** කාර්යාලයට දිවී ය.

(v) **නිර්දෝෂී** සිසුන් සිරගෙට **දැම්මොත්** අපි **හෙට** සටනට බසින්නෙමු. (ලකුණු 15 යි.)

7. (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) සුදුසු වෙලාවට ක්‍රියාත්මක වීම

(ii) අනාගතයේ සිදු විය හැකි දේ වර්තමානයේ සිට ම සැලසුම් කිරීම

(iii) එක කරදරයකින් මිදීම සඳහා තවත් කරදරයක පැටලීම

(iv) සත්පුරුෂයන් අතර අසත්පුරුෂයන් ද ගැවසීම

(v) ක්‍රියාවට නැංවිය නොහැකි දේ සැලසුම් කිරීම

(vi) තමන්ට උදව් කළ අය පසුව නොසලකා හැරීම (ලකුණු 03 යි.)

(ආ) පහත දී ඇති **රූඪිවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) අංමදිනවා

(ii) අරඅඳිනවා

(iii) ඇඟේ ගහනවා

(iv) ඉබිගමන

(v) උප්පරවැට්ටිය

(vi) ඉවක් බවක් නැති ව (ලකුණු 03 යි.)

(ඇ) පහත දී ඇති **එක් එක් යුගල පද සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) අල්ලාප - සල්ලාප

(ii) කායික - මානසික

(iii) තරහ - මරහ

(iv) උසුළු - විසුළු

(v) පවුල් - පන්සල්

(vi) අත - මිට (ලකුණු 03 යි.)

(ඈ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

(i) ටැක්ගැහෙනවා

(ii) ඇට්ටරකම

(iii) විජ්ජුම්බරය

(iv) පෙළවහ

(v) මූකළාන

(vi) සෝමාරියා (ලකුණු 03 යි.)

(ඉ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

(i) පන්නකාරයා

(ii) ආරතුල

(iii) වටමඑව

(iv) කොට්ටෝරුවා

(v) දියලබ්බ

(vi) අත්තම (ලකුණු 03 යි.)

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුරාධපුරයේප්‍රථමරාජධානියේමහමෙව්නාඋද්‍යානයමධ්‍යයෙහිසිසිල්සෙවණින්සුසැදිකොළතරපක්ෂීන්ගැවසිඅතුපතරවිහිදිමනරම්රන්තෙළඹුවෘක්ෂයක්වියඑයටඅධිගෘහීතවස්වර්ණමාලීනම්දෙව්දුවක්විසුවායඇරුමත්යසිරිමත්යපැහැපත්යබුව382 406කාලයෙහිරජකළදුටුගැමුණුරජතුමාමේරන්තෙළඹුවස්වර්ණමාලියගේවාසභවනයකපාඑතැනචෛත්‍යයක්ඉදිකිරීමටසිතීයඑයකැපීමටසැරසෙත්මඅනේමටවුණුවිපතඅනේමටවුණුවිපතකියමින්ඇහඬාවැලපෙන්නටවූවායරජතුමාඑහිගොස්ස්වර්ණමාලියෙනිකුමක්නිසාවැලපෙන්නෙහිදැයිවිචාළේයමාගේවාසභවනයවිනාශකරනනිසාවැලපෙමියිදෙව්දුවකීවායමේරන්තෙළඹුවකපාමමමෙහිමහසෑයබඳවමිකැමතිවරයක්ඉල්ලවයිකීයඑසේනම්මහරජතුමනිඒචෛත්‍යයටමාගේනමතබනුමැනවැයිඉල්ලාසිටියායඒදුටුගැමුණුරජතුමාඅග්‍රනරදේවයාඅසහායබෞද්ධපාලකයාදෙව්දුවටවූපොරොන්දුවඉටුකරමින්ස්වර්ණමාලීයනුවෙන්ඒචෛත්‍යයනම්කෙළේයමෙසේයථාවාදීතථාකාරීයම්සේකියයිදළසේකරනගුණයෙන්යුතුරජවරුලොවකොහිවෙසෙත්ද

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) **ඝෝෂ මහාප්‍රාණ** සහිත පද **දෙකක්** ඡේදයෙන් උපුටා දක්වන්න.

(iii) ඡේදයේ ඇති **'සෑදී'** යන පදයෙහි ඇතුළත් **පිල්ලම්** නම් කරන්න.

(iv) **රකාරාංශය** හා **යංශය** යන දෙක ම අන්තර්ගත ඔබ දන්නා පදයක් ලියන්න.

(v) ඉහත ඡේදයෙහි සඳහන් වන පදයක් **බැඳි අකුරක්** හා **රේඵයක්** සහිත ව නැවත ලියන්න. (ලකුණු 15 යි.)

* * *

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

Agaram.LK - Keep your dreams alive!